# රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
## அரச கணக்குகள் திணைக்களம்
## Department of State Accounts

මගේ අංකය / எனது இல. / My No. SA/MAA/02/01/03 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2022.10.31


**රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක : 2022/03**

**<u>රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි II කොටසෙහි 09 ඡේදයේ ඇතුළත් මු.රෙ. 429 යටතේ 2022 වසර සඳහා භාණ්ඩාගාර පොත් පියවීමට අදාළ මාර්ගෝපදේශ නිකුත්කිරීම</u>**

2018 අංක 19 දරණ ජාතික විගණන පනතෙහි 15 වන වගන්තිය අනුව රජයේ මූල්‍ය ප්‍රකාශන එක් එක් මුදල් වර්ෂය අවසන් වී මාස තුනක් (03) ඉකුත්වීමට පෙර භාණ්ඩාගාර ලේකම්වරයා විසින් විගණනය සඳහා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය. විගණකාධිපති විසින් රජයේ මූල්‍ය ප්‍රකාශන විගණනය එහි අන්තර්ගත වූ සෑම වියදම් ශීර්ෂයක් වෙනුවෙන්ම පිළියෙල කරනු ලැබූ මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් තොරතුරු මත සිදුකරනු ඇත. මෙම කාර්යය සඳහා ජාතික විගණන පනතේ 16(2) වන වගන්තියෙන් නියම කර ඇති පරිදි වාර්ෂික විසර්ජන පනත මගින් අරමුදල් වෙන්කරනු ලබන සෑම වියදම් ශීර්ෂයක්ම සිය (වාර්ෂික විසර්ජන ගිණුම, ආදායම් ගිණුම සහ අත්තිකාරම් ගිණුම් කටයුතුවලට අදාළ ගිණුම් ඇතුළු) වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය. මෙහිදී විගණනය සඳහා ප්‍රමාණවත් කාලයක් ලබාදෙන පරිදි අදාළ මූල්‍ය ප්‍රකාශන නිශ්චිත කාලසීමාවකදී විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. එබැවින්, සෑම වියදම් ශීර්ෂයකම 2022 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන 2023 පෙබරවාරි 28 වෙනි දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට හැකිවනු පිණිස 2022 මුදල් වර්ෂය සඳහා වූ පහත සඳහන් ගිණුම් පියවීමේ වැඩපිළිවෙල ක්‍රියාත්මක කරනු ලැබේ.

තවද, මුදල් රෙගුලාසි 150 ට අනුව, ඒකාබද්ධ අරමුදලින් වියදම් දරනු ලබන ආයතන එම මුදල් රෙගුලාසියේ අවශ්‍යතා ද ආවරණය වන අයුරින් මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් පිළියෙල යුතු වේ. එසේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාළ උපදෙස් හා ආකෘති පත්‍ර මෙම දෙපාර්තමේන්තුව විසින් ඉදිරියේ දී නිකුත් කරනු ඇත.

2. මුදල් රෙගුලාසි අංක 429 අනුව 2022 මුදල් වර්ෂයේ ගිණුම් පොත් 2022 දෙසැම්බර් 31 දිනට පියවිය යුතු අතර අදාළ වර්ෂය සඳහා වන ගිණුම් සාරාංශ, මාරු නියෝග හා අනෙකුත් ගිණුම් වාර්තා නිවැරදිව හා විධිමත්ව මෙම මාර්ගෝපදේශයේ 04 වන ඡේදයේ සඳහන් දිනයන්ට හෝ ඊට පෙර රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතු බව අවධාරණය කරනු ලැබේ.

3. පොදු කරුණු

3.1 රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ **https://newcigas.treasury.gov.lk** වෙබ් අඩවියේ ඇතුළත් කර ඇති ඔබ අමාත්‍යාංශයේ /දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වැය ශීර්ෂයට අදාළ මාසික ගිණුම් විස්තර පරීක්ෂාකර ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැතිව වැය විෂයන්ට කරන ලද හර කිරීම් ඇත්නම් ඒවා වහාම නිවැරදි කිරීමට කටයුතු කළ යුතු ය.


මහා භාණ්ඩාගාරය, කොළඹ 01, ශ්‍රී ලංකාව. பொது திறைசேரி, கொழும்பு 01, இலங்கை. General Treasury, Colombo 01, Sri Lanka.
General - Tel.: +94 11 2484500/600 Ext.: 1149 Fax : +94 11 2484869 Website : www.sad.gov.lk
Director General - Tel.: +94 11 2484728 Fax : +94 11 2473856 e -mail : dgsa@sad.treasury.gov.lk

3.2 පරිපූරක ගිණුම් සාරාංශ මගින් වෙනත් අමාත්‍යාංශයක/ දෙපාර්තමේන්තුවක/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයක ගිණුම්වලට අදාළ සටහන් යොදන අවස්ථාවලදී ඒ සඳහා එම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පූර්ව අනුමැතිය ලබාගත යුතුවේ.

3.3 සාවද්‍ය ගිණුම් තැබීමක් නිවැරදි කිරීම සඳහා වන ජර්නල් සටහන් භාණ්ඩාගාරයට යොමු කළ යුත්තේ අදාළ අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිගාස් (CIGAS) වැඩසටහන මගින් එම ගිණුම් සටහන් නිවැරදි කිරීම ප්‍රායෝගික නොවන අවස්ථාවලදී පමණි. එවැනි නිවැරදි කිරීමක් සඳහා මෙම දෙපාර්තමේන්තුවට යොමු කරනු ලබන ජර්නල් සටහන්වල සඳහන් තොරතුරුවල නිරවද්‍යතාවය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරී / ගණන්දීමේ නිලධාරී වෙත වගකීම පැවරෙනු ඇත.

3.4 2022 වර්ෂය සඳහා ඒ ඒ ආයතනයට අදාළ අවසන් භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන මෙම දෙපාර්තමේන්තුවේ https://newcigas.treasury.gov.lk වෙබ් අඩවියට නිකුත් කරනු ලැබේ. 2022 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහතික කරනු ලැබූ අවසන් භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශනයන්හි තොරතුරු අනුව පමණක් සකස් කළ යුතු බව විශේෂයෙන් අවධාරණය කෙරේ.

3.5 2022 වර්ෂය තුළ යම් අමාත්‍යාංශයක්, දෙපාර්තමේන්තුවක් හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයක් විසින් වෙනත් රජයේ හෝ පෞද්ගලික ආයතනයකින් භාණ්ඩ හා සේවා ලබාගෙන ඇත්නම් ඊට අදාළ බිල්පත් 2022 දෙසැම්බර් 31 වන දින හෝ ඊට පෙර පියවා ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුවේ.

3.6 මු.රෙ. 215(3)(ඇ) අනුව වැය ශීර්ෂයන්හි වසර අවසානයට ඉතිරි ප්‍රතිපාදන තැන්පත් ගිණුම්වලට මාරුකිරීම් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇත්නම් පමණක් සිදුකරනු ඇත. එසේ අනුමැතිය ලද ඉතිරි ප්‍රතිපාදන මාරුකිරීම් සඳහා නව තැන්පතු ගිණුම් අංකයක් උප ගිණුමක් ලෙස රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් 2022 වර්ෂය වෙනුවෙන් අදාළ ආයතන වෙත සපයනු ලැබේ. එබැවින් කුමන හේතුවක් නිසාවත් දැනට පවත්වාගෙන යනු ලබන පෙර වර්ෂවලට අදාළ අයවැය ප්‍රතිපාදන මාරු කර ඇති තැන්පත් ගිණුම්වලට හෝ අනෙකුත් තැන්පත් ගිණුම්වලට 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රතිපාදන මාරුකිරීම සිදුනොකල යුතු ය. ඉහත ඉල්ලීම් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමේදී අදාළ වැය ශීර්ෂයේ ප්‍රමාණවත් ප්‍රතිපාදන තිබේද යන්න තහවුරු කරගත යුතු ය.

3.7 රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 243/2015 ට අනුව කටයුතු කිරීමෙන් අනතුරුව තැන්පතු කාණ්ඩ 6000/15 සහ 6003 හි තවදුරටත් ශේෂ පවතිනම් එම ශේෂ 2022 වර්ෂය නිමවීමට පෙර අදාළ තැන්පතු කාණ්ඩවලට මාරු කළ යුතු ය. එසේ මාරු කිරීමට අවශ්‍ය නොවන ශේෂ රාජ්‍ය ආදායමට බැර කර 6000/15 හා 6003 තැන්පතු කාණ්ඩයේ ගිණුම් පියවා අවසන් කළ යුතු ය.

3.8 ගිණුම් පියවීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට ප්‍රථම අමාත්‍යාංශයේ /දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොත්වල පෙන්නුම් කෙරෙන සියලුම ගිණුම් 2022



රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය
මහ ලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
දු.අ.- 94 11 2484728 /ෆැක්ස්- 94 11 2473856 / විද්‍යුත් තැපැල- dgsa@sad.treasury.gov.lk

අවසන් භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශනයන්හි ගිණුම් තොරතුරු සමඟ සසඳා විෂමතාවයන් නොමැති බවට තහවුරු කරගත යුතු ය.

3.9 මූල්‍ය නොවන වත්කම්හි ගිණුම්මය නිවැරදිතාවය පවත්වා ගැනීම අදාළ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු වගකීමක් වන අතර ආයතනයේ පොත්වල ශේෂයන් සෑමවිටම භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශනයෙහි වත්කම් ලෙජර් ශේෂ හා CIGAS Web Interface හරහා උඩුගත කරනු ලබන කේවල ශේෂ සමඟ සමාන විය යුතු ය.

3.10 රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් පහත 04 වන ඡේදයේ දැක්වෙන දින වකවානු අනුව භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන නිකුත් කරන බැවින්, නියමිත දින වකවානු තුළ අවසන් ගිණුම් සාරාංශ හා පරිපූරක ගිණුම් සාරාංශ ඉදිරිපත් කිරීම අදාළ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල වගකීම වේ. එසේ නියමිත දිනට අදාළ ගිණුම් සාරාංශ හා අදාළ අනෙකුත් ගිණුම් වාර්තා ඉදිරිපත් නොකරන ආයතනවල වියදම් අවසන් භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශනවලින් හෙළිදරව් නොවනු ඇත. එලෙස අවසන් භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශනවලින් නිවැරදි මූල්‍ය තත්ත්වය හෙළිදරව් නොවීම පිළිබඳව විගණකාධිපති විමසුම්වලට ලක්වීම වැළැක්වීම සඳහා නියමිත දින වකවානු තුළ තම වැය ශීර්ෂයේ සියලු වියදම් භාණ්ඩාගාරය වෙත වාර්තා කිරීම සඳහා සියලුම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් / ගණන්දීමේ නිලධාරීන් විධිමත් වැඩපිළිවෙලක් සකසා ගත යුතු ය.

4. 2022 මුදල් වර්ෂයේ ගිණුම් පියවීමේ කාර්යය සඳහා වූ ඉදිරි වැඩසටහන

| අනු අංකය | කාර්යය | කාර්යය සම්බන්ධ පැහැදිලි කිරීම් | කාර්යය නිම කළ යුතු නිශ්චිත අවසාන දිනයන් |
|---|---|---|---|
| 4.1 | **2022 වර්ෂයේ මුදල් පොත පියවීම** | මුදල් පොත පියවීම භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන උපදෙස් අනුව සිදුකල යුතු ය. | **2022 දෙසැම්බර් 31 දින** |



රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය
මහ ලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
දු.අ.- 94 11 2484728 /ෆැක්ස්- 94 11 2473856 / විද්‍යුත් තැපැල- dgsa@sad.treasury.gov.lk

| | | | |
|---|---|---|---|
| 4.2 | **2022 දෙසැම්බර් මාසයට අදාළ ගිණුම් සාරාංශය ඉදිරිපත් කිරීම** | 2022 දෙසැම්බර් මාසයට අදාළ ගනුදෙනු ඇතුළත් ගිණුම් සාරාංශය ඉදිරිපත් කළ යුතු ය. | **මාර්ගෝපදේශ 01 232/2013 රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයට අනුව**<br>**(i) පළමු උපලේඛණයේ සඳහන් ආයතන 2023 ජනවාරි 09 ට පෙර**<br>**(ii) දෙවන උපලේඛණයේ සඳහන් ආයතන 2023 ජනවාරි 11 ට පෙර** |
| 4.3 | **2022 වර්ෂයේ දෙසැම්බර් මස භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන නිකුත් කිරීම** | 2022 දෙසැම්බර් මස ගිණුම් සාරාංශයේ අන්තර්ගත ගනුදෙනු ඇතුළත් භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන භාණ්ඩාගාර වෙබ් අඩවිය වන **https://newcigas.treasury.gov.lk** හි රාජ්‍ය ගිණුම් වෙබ් පිටුව වෙත මුද්‍රාහරිනු ලැබේ. | **2023 ජනවාරි 13** |
| 4.4 | **පළමු පරිපූරක ගිණුම් සාරාංශය ඉදිරිපත් කිරීම** | 2022 වර්ෂයේ දෙසැම්බර් මාසයේ ගිණුම් සාරාංශයේ ඇතුළත් කිරීමට නොහැකි වූ ගනුදෙනු පමණක් ඇතුළත් කර **"පළමු පරිපූරක ගිණුම් සාරාංශය"** ඉදිරිපත් කළ යුතු ය. මෙහිදී CIGAS වැඩසටහනෙහි 2022 දෙසැම්බර් මාසය සඳහා වූ මාසික ගිණුම් වැසීමේ ක්‍රියාවලිය (Month End Process) සම්පූර්ණ කිරීමෙන් පසු පමණක් පළමු පරිපූරක ගිණුම් සාරාංශය ඉදිරිපත් කිරීම සිදුකල යුතු ය. | **2023 ජනවාරි 20 දින හෝ ඊට පෙර** |



රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය
මහ ලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
දු.අ.- 94 11 2484728 /ෆැක්ස්- 94 11 2473856 / විද්‍යුත් තැපැල- dgsa@sad.treasury.gov.lk

| | | | |
|---|---|---|---|
| 4.5 | බැඳීම් හා බැරකම් නව සිගාස් වෙබ් යෙදුම වෙත උඩුගත කිරීම | එක් එක් වියදම් ශීර්ෂ විසින් මු.රෙ. 94(1) ට අනුකූලව නව සිගාස් වෙබ් යෙදුම වෙත උඩුගත කරන ලද බැඳීම් හා බැරකම් පිළිබඳ වාර්තාවක් පළමු භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන සමඟ නිකුත් කරනු ලැබේ. බැඳීම් හා බැරකම් පිළිබඳ තවදුරටත් සිදුකළ යුතු ගැලපීම් තිබේනම් එකී ගැලපීම් සිදුකර පළමු පරිපූරක ගිණුම් සාරාංශය මගින් වාර්තා කළ යුතු ය.<br>බැඳීම් හා බැරකම් පිළිබඳ වාර්තාවේ දෘඪ පිටපත්/මෘදු පිටපත් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම අවශ්‍ය නොවේ. | **2023 ජනවාරි 20** දින හෝ ඊට පෙර |
| 4.6 | පළමු පරිපූරක ගිණුම් සාරාංශ තොරතුරු ද ඇතුළත් කර පළමු පරිපූරක භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන නිකුත් කිරීම | 2022 දෙසැම්බර් ගිණුම් සාරාංශයෙන් සහ පළමු පරිපූරක ගිණුම් සාරාංශයෙන් වාර්තා කරන ලද සියලු ලැබීම් හා ගෙවීම් හා වැරදි නිවැරදි කිරීම් ඇතුළත් පළමු පරිපූරක භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන භාණ්ඩාගාර වෙබ් අඩවිය වන **https://newcigas.treasury.gov.lk** වෙත මුදාහරිනු ලැබේ. | **2023 ජනවාරි 24** |
| 4.7 | දෙවන හා අවසාන භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන නිකුත් කිරීමට පෙර මු.රෙ. 69 අයදුම් පත්‍ර ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම | මු.රෙ.69 අයදුම්පත් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අනුමැතියෙන් පසු රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට යොමු කළ යුතු ය. | **2023 ජනවාරි 26** දින හෝ ඊට පෙර |
| 4.8 | තවදුරටත් ගිණුම්වල ඇති වැරදි නිවැරදි කිරීම් ඇතුළත් දෙවන හා අවසන් පරිපූරක ගිණුම් සාරාංශය රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම | 2022 වර්ෂයට අදාළ සියලු නිවැරදි කිරීම් CIGAS වැඩසටහනට ඇතුළත් කර දෙවන හා අවසන් පරිපූරක ගිණුම් සාරාංශය රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. | **2023 ජනවාරි 27** දින හෝ ඊට පෙර |



රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය
මහ ලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
දු.අ.- 94 11 2484728 /ෆැක්ස්- 94 11 2473856 / විද්‍යුත් තැපැල- dgsa@sad.treasury.gov.lk

| | | | |
|---|---|---|---|
| 4.9 | දෙවන පරිපූරක භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන නිකුත් කිරීම | දෙවන හා අවසන් පරිපූරක ගිණුම් සාරාංශයේ ඇතුළත් නිවැරදි කිරීම් හා මු.රෙ. 69 මාරු කිරීම් ඇතුළත් කර දෙවැනි පරිපූරක භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන නිකුත් කරනු ලැබේ. | 2023 පෙබරවාරි 02 දින |
| 4.10 | මූල්‍ය නොවන වත්කම් CIGAS වැඩසටහන වෙත උඩුගත කිරීම | 2022 වර්ෂයට අදාළ සියලු මූල්‍ය නොවන වත්කම් CIGAS වැඩසටහන වෙත (CIGAS Web Interface) උඩුගත කළ යුතු ය.<br>මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ දෘඪ පිටපත්/මෘදු පිටපත් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම අවශ්‍ය නොවේ. | 2023 පෙබරවාරි 03 දින හෝ ඊට පෙර |
| 4.11 | භාණ්ඩාගාර මෙහෙයුම්, තැපැල්, දේශීය ආදායම්, රේගු , දුම්රිය, රාජ්‍ය ව්‍යාපාර යන දෙපාර්තමේන්තු විසින් ජර්නල් සටහන් ඉදිරිපත් කිරීම | ඉහත දෙවන පරිපූරක භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශනයන්හි සඳහන් තොරතුරු අනුව අවශ්‍ය ජර්නල් සටහන් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. | 2023 පෙබරවාරි 07 දින හෝ ඊට පෙර |
| 4.12 | 2022 වර්ෂය සඳහා වූ අවසන් භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන නිකුත් කිරීම | හඳුනාගන්නා ලද සියලු ගිණුම් දෝෂ නිවැරදි කිරීම් හා ගිණුම්වල අදාළ මාරුකිරීම් සඳහා වූ ජර්නල් සටහන් ඇතුළත් කරමින් අවසන් භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. මෙම ගිණුම් ප්‍රකාශන ලබාගැනීම සම්බන්ධයෙන් මෙහි 3.4 ඡේදයේ උපදෙස් අනුව ක්‍රියාකළ යුතු ය. | 2023 පෙබරවාරි 10 |



රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය
මහ ලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
දු.අ.- 94 11 2484728 /ෆැක්ස්- 94 11 2473856 / විද්‍යුත් තැපැල- dgsa@sad.treasury.gov.lk

| | | | |
|---|---|---|---|
| 4.13 | අත්තිකාරම් ගිණුම් | සියලුම අත්තිකාරම් ගිණුම්වල මුල් පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු අතර ඒවායේ අනු පිටපත් රාජ්‍ය ගිණුම් හා ජාතික අයවැය දෙපාර්තමේන්තු වෙත යොමු කළ යුතු ය.<br><br>මු.රෙ. 506(ඇ) ප්‍රකාරව 2020 වර්ෂයේ නිකුත් කර ඇති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 04 පරිදි සකස් කරනු ලබන රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම් වාර්ෂික සැසඳුම් ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී දෘඪ පිටපතට අමතරව මෘදු පිටපතක් loaninfor@sad.treasury.gov.lk ඊමේල් ලිපිනයට එවිය යුතු ය. | **2023 පෙබරවාරි 28 දින හෝ ඊට පෙර** |

5. ඒ අනුව, සියලු අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් මෙම මාර්ගෝපදේශයේ සඳහන් උපදෙස් අනුගමනය කළ යුතු බව අවධාරණය කෙරේ.

6. මෙම මාර්ගෝපදේශය සම්බන්ධව තවදුරටත් පැහැදිලි කිරීම් අවශ්‍ය වන්නේ නම් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (සාර්ව ගිණුම් හා අත්තිකාරම් ගිණුම්) දුරකථන අංක 0112484733, අධ්‍යක්ෂ (රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන හා කළමනාකරණ තොරතුරු) දුරකථන අංක 0112484649, සහකාර අධ්‍යක්ෂ (ITMIS, මූල්‍ය තොරතුරු හා වාර්තාකරණ) දුරකථන අංක 0112151485, අධ්‍යක්ෂ (පද්ධති සංවර්ධන, පුහුණු) දුරකථන අංක 0112484826, අධ්‍යක්ෂ (ගිණුම් මෙහෙයවීම හා වැටුප් මෘදුකාංග කළමනාකරණ) දුරකථන අංක 0112440857 ඇමතීමෙන් ලබාගත හැකිය.

ඩබ්.ඒ. සමන්ත උපනන්ද
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් 1. විගණකාධිපති
2. අධ්‍යක්ෂ ජනරාල් - භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
3. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අයවැය දෙපාර්තමේන්තුව
4. අධ්‍යක්ෂ - ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකා මහ බැංකුව



රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය
මහ ලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
දු.අ.- 94 11 2484728 /ෆැක්ස්- 94 11 2473856 / විද්‍යුත් තැපැල- dgsa@sad.treasury.gov.lk